# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1772/10 – 2012 අගෝස්තු 22 වැනි බදාදා – 2012.08.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 අ (1) වැනි වගන්තිය යටතේ නියමය

2008 මාර්තු මස 03 වැනි දින අංක 1539/9 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වන අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළකරන ලද 2008 අංක 65 හා 2008.02.27 වැනි දින දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: එල්ඩී/05/2007/එච්ඩබ්/එස්ටීඩීපී/ජේබීඅයිසී/67.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: මිල්/ඉ/4/2/68.
2012 අගෝස්තු මස 16 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර", ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මුංවත්තබාගෙ පත්තුව සුළු කොට්ඨාසයේ, 643, පැල්පොල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ගල්පාත යන ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ක. 4265 හා 2010.06.23 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් සඳහන් කර ඇති පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලට මායිම්:

**කැබලි අංක 01 – ගල්හේනවත්ත, ගොරකගහලන්ද, අන්නාසිගලහේන, පයින්හිල්වත්ත – ප්‍රමාණය: හෙක්. 0.0612**

උතුරට: මු.පි.ක. 792හි කැබලි අංක 6 සහ මු.පි.ක. 3586 හි කැබලි අංක 75; නැගෙනහිරට: මු.පි.ක. 3586 හි කැබලි අංක 76; දකුණට: මු.පි.ක. 3586 හි කැබලි අංක 76 සහ මාර්ගය; බටහිරට: මු.පි.ක. 3586 හි කැබලි අංක 76, මාර්ගය, මු.පි.ක. 3586 හි කැබලි අංක 77, 78 සහ මු.පි.ක. 792 හි කැබලි අංක 6.

08 - 117

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39අ(1) වැනි වගන්තිය යටතේ නියමය

2009 ජනවාරි මස 16 වැනි දින අංක 1584/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද 2009 අංක 7 දරන (460 වන අධිකාරිය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාවෙන් සහ අංක ගම් 3775 දරන පිඹුරේ සඳහන් කැබලි අංක 01 යන ඉඩම් කොටස රජය වෙත සම්පූර්ණයෙන් ම සතු වී ඇති අතර, රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද) 39අ(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ඉඩම් සහ

ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම, පහත උපලේඛනයෙහි සඳහන් ඉඩම් කොටස මෙම නියමය මගින් අවසතු කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: එල්ඩී/05/2008/එච්/100.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: මීරි/ඉ/5/14/2007.
2012 අගෝස්තු මස 16 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩුගහපත්තුව සුළු කොට්ඨාසයේ, දංඕවිට ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක ගම් 3775 හා 2010.11.30 වැනි දින දරන මූලික පිඹුරේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්. 0.0322ක් පමණ වන ගොන්නගහලන්ද නමැති ඉඩම් කොටස් එකට (01) මායිම්:

01. **කැබලි අංක 01 – ගොන්නගහලන්ද – ප්‍රමාණය: හෙක්. 0.0322 ක් පමණ**

උතුරට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ ආර්. ඩී. ලාල් හිමිකම් කියන ගොන්නගහලන්ද; නැගෙනහිරට: ආර්. ඩී. ලාල් හිමිකම් කියන ගොන්නගහලන්ද සහ මෙම ඉඩමේ ඉතිරි කොටස; දකුණට: මෙම ඉඩමේ ඉතිරි කොටස සහ මාර්ගය; බටහිරට: මාර්ගය සහ මෙම ඉඩමේ ඉතිරි කොටස.

08 - 118

## ශුද්ධි පත්‍රිකාව

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2012 අංක 28 දරන ආඥාව**

2012.02.23 දිනැති අංක 1746/13 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* 7ඒ පිටුවේ කැබලි අංක 119 හි ඉඩමේ ප්‍රමාණය "හෙක්. 0.0420" ක් යන්න වෙනුවට ප්‍රමාණයෙන් "හෙක්. 0.0042"ක් යනුවෙන් සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍ය.

මගේ යොමු අංකය: එල්ඩී/05/2007/එච්ඩබ්/242.
ප්‍රාදේශීය ලේකම්ගේ අංකය: 4/3/1/119.
2012 අගෝස්තු මස 16 වැනි දින,
ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය,
"මිහිකත මැදුර",
ඉඩම් මහලේකම් කාර්යාලය,
අංක 1200/6,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

08 - 116

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.